<u>නිපුණතා මට්ටම 5.8.2: පුරුෂ ප්‍රජනක පද්ධතියේ ව්‍යුහය හා කෘත්‍යය විමසා බලයි.</u>

<u>ඇගයීම</u>

1) මානව පුරුෂ ප්‍රජනන පද්ධතියට අයත් අභ්‍යන්තර ව්‍යුහ නම් කර ඒවායේ කෘත්‍යය ලියන්න
2) පුරුෂ ප්‍රජනන පද්ධතියට අයත් ව්‍යුහ පෙන්වීමට සම්පූර්ණයෙන් නම් කල රූප සටහනක් අඳින්න
3) බාහිර පුරුෂ ප්‍රජනන අවයව නම් කරන්න
4) වෘෂණ කෝෂ තුල අන්තර්ගත ව්‍යුහ නම් කරන්න
5) වෘෂණ වෘෂණ කෝෂ තුල බාහිරයට පිහිටීමේ වැදගත්කම කුමක්ද
6) ශුක්‍රාණු හැරුණු විට වෘෂණ අභ්‍යන්තරයේ දැකගත හැකි ප්‍රධාන සෛල වර්ග නම් කර කෘත්‍ය ලියන්න
7) හරස්කඩක් භාවිතයෙන් ශුක්‍රධර නාලිකාවේ අන්වීක්ෂීය ව්‍යුහය පෙන්වීමට සම්පූර්ණයෙන් නම් කල රූප සටහනක් ඇඳ එහි කොටස් නම් කරන්න
8) ඔබ ඉහත ඇඳ දැක්වූ රූපයේ එක් එක් කොටසේ කෘත්‍ය කෙටියෙන් පැහැදිලි කරන්න
9) වෘෂණ තුල අඩු උෂ්ණත්වයක් පවත්වා ගැනීමට හේතුවන අනුවර්තන දෙකක් ලියන්න
10) අපිවෘෂණයේ කෘත්‍ය කුමක්ද
11) පුරුෂ මුත්‍ර මාර්ගයේ කෘතයන් දෙකක් ලියන්න
12)ශුක්‍ර ආශයිකා තරලයේ අඩංගු ද්‍රව්‍ය නම් කරන්න
13)පුරස්ථ ග්‍රන්ථි ග්‍රාව වල අඩංගු ද්‍රව්‍ය නම් කරන්න
14)ශුක්‍රාණු ජනනයට අදාළ විවිධ සෛල වර්ග ඒක ගුණ සහ ද්විගුණ ලෙස වෙන් කර දක්වන්න
15)මානව ශුක්‍රාණුවේ ව්‍යුහය පෙන්වීමට සම්පූර්ණයෙන් නම් කල රූප සටහනක් අඳින්න
16)ශුක්‍ර තරලයේ ප්‍රධාන සංඝටක නම් කරන්න
17)ශුක්‍රාණු ජනනයේ හෝර්මෝනමය යාමනය පෙන්වීමට ගැලීම් සටහනක් ඇඳ දක්වන්න

<u>රචනා</u>

18)පුරුෂ ප්‍රජන පද්ධතියේ ව්‍යුහය සහ කෘත්‍ය විස්තර කරන්න
19)ශුක්‍රාණු ජනනයේ හෝර්මෝනමය යාමනය සමග ශුක්‍රාණු ජනනය විස්තර කරන්න
20)කෙටි සටහන් ලියන්න
පුරුෂ ප්‍රජනන පද්ධතිය ආශ්‍රිත ග්‍රන්ථි
ශුක්‍ර තරලය
මානව ශුක්‍රාණුව

වැඩි දුර කියවීම - ජීව විද්‍යාව සත්ව ආකාරය සහ ක්‍රියාකාරිත්වය II සම්පත් පොතේ පිටු අංක 49-55

සැකසුම - අනුජා උදය කුමාරි , ර/ කුරුවිට මධ්‍ය මහා විද්‍යාලය, කුරුවිට